**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

**ශාස්ත්‍ර පීඨ විද්‍යාර්ථීන්ගේ සංගමය**
**கலைப் பீட வித்யார்த்திகல் சங்கம்**
**Arts Faculty Alumni Association**

# ව්‍යවස්ථාව

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය
## ශාස්ත්‍ර පීඨ විද්‍යාර්ථීන්ගේ සංගමය

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍ර පීඨ විද්‍යාර්ථීන්ගේ සංගමය**

**(AFAAUP)**

(ආරම්භය 2022)

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

# ව්‍යවස්ථාව
# පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය
# ශාස්ත්‍ර පීඨ විද්‍යාර්ථීන්ගේ සංගමය

(ආරම්භය 2022)

## I වගන්තිය: සංගමයේ නම

සංගමයේ නම " **පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍ර පීඨ විද්‍යාර්ථීන්ගේ සංගමය**" විය යුතුවන අතර මෙතැන් සිට එය, මෙහිදී "**සංගමය**" ලෙස හැඳින්වේ. "**පේරාදෙණිය ශාස්ත්‍ර පීඨය**" යන ප්‍රකාශනයට යුනිවර්සිටි කොලේජ් (1921-1942) සිට, ලංකා විශ්වවිද්‍යාලය (1942-1967), ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණිය (1967-1978), ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණිය මණ්ඩපය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව (1979 සිට), දක්වා වන සියලු ශාස්ත්‍ර පීඨ ඇතුළත් විය යුතුවන අතර මෙතැන් සිට එය, මෙහි "**පීඨය**" ලෙසින් හඳුන්වනු ලැබේ.

## II වගන්තිය: සංගමයේ අරමුණු

සංගමයේ අරමුණු පහත පරිදි විය යුතුය;

1. පීඨය සහ එහි සිසුන් අතර සහ විද්‍යාර්ථීන් අතර සමීප සබඳතා දිරිමත් කිරීම, පෝෂණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
2. පීඨයට සහ විද්‍යාර්ථීන්ට මූල්‍යමය වශයෙන් සහ වෙනත් ආකාරයකින් හෝ උපකාර කිරීම සහ සහාය වීම.
3. විද්‍යාර්ථීන්ගේ ප්‍රයෝජනය සඳහා සේවාවන් ආරම්භ කිරීම සහ සහාය වීම.
4. පීඨයේ කටයුතු සම්බන්ධයෙන් විද්‍යාර්ථීන්ගේ මණ්ඩලයේ උනන්දුව ප්‍රවර්ධනය කිරීම සහ විද්‍යාර්ථීන්ගේ ප්‍රයෝජනය සඳහා වැඩසටහන් සකස් කිරීම සහතික කිරීම.
5. විද්‍යාර්ථීන් සහ පීඨයේ සිසුන් අතර සමීප සබඳතාවයක් ප්‍රවර්ධනය කිරීම සහ ශිෂ්‍ය සුබසාධන වැඩසටහන් සඳහා උපකාර කිරීම සහ සහාය වීම.
6. විද්‍යාර්ථීන්, පීඨය සහ එහි සිසුන් අතර තොරතුරු හුවමාරු කර ගැනීම.
7. විද්‍යාර්ථීන් අතර මිත්‍රත්වය සහ අවබෝධය ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.
8. පීඨය සහ විද්‍යාර්ථීන් අතර ජාලකරණය සහ සන්නිවේදන මාර්ග දියුණු කිරීම.
9. උසස් වෘත්තීය මට්ටමක් පවත්වා ගැනීම සඳහා විද්‍යාර්ථීන්ට සහාය වීම.

10. විද්‍යාර්ථීන් අතර ශාස්ත්‍රීය හා සමාජීය ඇසුර වැඩි දියුණු කිරීම.
11. විද්‍යාර්ථීන් අතර විද්වත් හා බුද්ධිමය වර්ධනය දිරිමත් කිරීම.
12. පීඨයේ අරමුණු ප්‍රවර්ධනය කිරීමේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ සංගමය සහ විශ්වවිද්‍යාලයේ අනෙකුත් පීඨ විද්‍යාර්ථී සංගම් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
13. සංගමයේ ඉහත අරමුණු සහ එම අරමුණුවලට අනුකූල වන වෙනත් අරමුණු ප්‍රවර්ධනය කිරීම.

## III වගන්තිය: සංගමයේ අනුශාසක

ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා නිලබලයෙන්ම සංගමයේ අනුශාසකවරයා වන්නේය.

## IV වගන්තිය: සාමාජිකත්වය

**1. සාමාජිකයින් කාණ්ඩ තුනකින් සමන්විතවේ:**

**i) සාමාන්‍ය සාමාජිකයන්:**

**අ)** පීඨයේ උපාධි වැඩසටහනක් හෝ පීඨයේ පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහනක් සම්පූර්ණ කර ඇති ඕනෑම පුද්ගලයෙක්. හෝ
**ආ)** පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු වන ඕනෑම පුද්ගලයෙක්. හෝ
**ඇ)** විශ්වවිද්‍යාල උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් සහිතව පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු වන හෝ එහි සාමාජිකයෙකු වී සිටින ඕනෑම පුද්ගලයෙක්.

**ii) ආශ්‍රිත සාමාජිකයන්:**

අ) සාමාන්‍ය සාමාජිකයෙකු වීමට හිමිකම් නොලබන පීඨයේ ඕනෑම ආදි ශිෂ්‍යයෙක්. හෝ
ආ) පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මාණ්ඩලික ශ්‍රේණියේ සාමාජිකයෙකු වන ඕනෑම පුද්ගලයෙක්.

**iii) ගෞරවනීය සාමාජිකයින්:**

අ) සාමාන්‍ය සාමාජිකත්වය සඳහා සුදුසුකම් නොලබන නමුත් පීඨයට විශිෂ්ට සේවාවක් ඉටු කර ඇති ඕනෑම තැනැත්තෙකු විධායක කමිටුව විසින් නම් කර එක් වසරක කාලයක් සඳහා ගෞරවනීය සාමාජිකයෙකු ලෙස සංගමය විසින් තෝරා පත් කර ගත හැකි අතර, අවශ්‍ය යැයි සැලකේ නම්, විධායක කමිටුව විසින් එම සාමාජිකත්වය තවත් එක් වසරක කාලයක් සඳහා දීර්ඝ කළ හැක.

## V වගන්තිය: විධායක කමිටුව සහ නිලධාරී මණ්ඩලය

**1. සංගමයේ විධායක කමිටුව පහත සඳහන් පුද්ගලයන්ගෙන් සමන්විත විය යුතුය;**

i) සංගමයේ නිලධාරී මණ්ඩලය;
ii). පීඨයේ පීඨාධිපතිවරයා හෝ පීඨාධිපතිවරයා විසින් නම් කරන ලද පීඨ මණ්ඩලය නියෝජනය කරන නියෝජිත / ශාස්ත්‍ර පීඨයේ පීඨ සම්බන්ධීකාරක.
Iii). නිලබලයෙන් හිමිවන උප සභාපති තනතුරුධාරීන් ; සිය අධ්‍යයන කටයුතු නිමකොට ශාස්ත්‍ර පීඨයෙන් වාර්ෂිකව පිටව යන විද්‍යාර්ථීන් විසින් විධිමත් පරිදි පිහිටුවාගනු ලබන විද්‍යාර්ථී සංගම්වල සභාපතිවරුන් , සිය නිලබලයෙන්ම, මෙම සංගමයේ විධායක කාරක සභාවේ උප සභාපතිවරුන් වන අතර ඔවුන් මෙම සංගමයේ යාවජීව සාමාජිකයන් ද වන්නේය.
iv). පසුගිය වසරේ සේවය කළ සංගමයේ සභාපතිවරයා.
v). සංගමයේ නිලධාරී මණ්ඩලය

**2. සංගමයේ නිලධාරී මණ්ඩලය පහත සඳහන් පරිදි විය යුතුය.**

i). සභාපතිවරයා

ii). උප සභාපතිවරු පස් දෙනෙක්

iii). ප්‍රධාන ලේකම්වරයා

iv). සහකාර ලේකම්වරු දෙදෙනෙක්

v). භාණ්ඩාගාරිකවරයා

vi). සහකාර භාණ්ඩාගාරික

vii). සංස්කාරකවරයා

viii). අභ්‍යන්තර විගණකවරයා

ix). කමිටු සාමාජිකයන් පස්දෙනෙකු

x). නියෝජිතයන් තිදෙනෙකු බැගින්; සිය අධ්‍යයන කටයුතු නිමකොට ශාස්ත්‍ර පීඨයෙන් වාර්ෂිකව පිටව යන විද්‍යාර්ථීන් විසින් විධිමත් පරිදි පිහිටුවාගනු ලබන විද්‍යාර්ථී සංගම්වල සභාපතිවරයා, ලේකම්වරයා සහ භාණ්ඩාගාරිකවරයා, සිය නිළබලයෙන්ම, මෙම සංගමයේ විධායක කාරක සභාවේ සාමාජිකයන් ද වන්නේය.

3. සංගමයේ අධිකාරී බලය විධායක කමිටුව වෙත පැවරෙන අතර, විධායක කමිටු රැස්වීම්වල මුලසුන දරණු ලබන්නේ සංගමයේ සභාපතිවරයා හෝ ඔහු /ඇය නොමැති අවස්ථාවක උප සභාපතිවරයෙකු විසිනි.

4. සංගමයේ නිශ්චිත අරමුණක් සඳහා පත් කර ඇති විධායක කමිටු, ස්ථාවර කමිටු, අනු කමිටු හෝ ඕනෑම කමිටුවක රැස්වීම්, පවතින තත්ත්වයට අනුව නිවැරදි නවීන තාක්ෂණය තෝරා ගනිමින් භෞතික හෝ මාර්ගස්ත හෝ දෙමුහුන් ආකෘතියකින් හෝ පැවැත්විය යුතුය. රැස්වීමක් සඳහා වන ගණපූරණය එහි සාමාජිකත්වයෙන් තුනෙන් එකකට නොඅඩු විය යුතුය.

5. සාමාන්‍ය සාමාජිකත්වයේ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා විධායක කමිටුව වගකිව යුතුවන අතර එය හැකි සෑම විටකදීම හමුවිය යුතුය. වාර්ෂික මහා සභා රැස්වීමකදී නව නිලධාරී මණ්ඩලය තෝරා පත් කර ගනු ලබන අතර ඔවුන් විසින් වසරක කාලයක් සඳහා එම නිලතල දරනු ලැබේ. නිලධාරී මණ්ඩලය සහ විධායක කමිටු සාමාජිකයින් පස්දෙනා නැවත තේරී පත්වීම සඳහා සුදුසුකම් ලැබිය යුතු අතර, කිසිදු නිලධාරියෙකු අඛණ්ඩව වසර තුනකට වඩා වැඩි කාලයක් එකම නිලය නොදැරිය යුතුවේ.

6. කිසියම් හේතුවක් නිසා යම් නිලධරයෙකුගේ තනතුර වසරකට පෙර පුරප්පාඩු වන්නේ නම්, විධායක කමිටුව විසින් ඒ වෙනුවෙන් ඉතිරි නිල කාලය සඳහා සුදුසු පුද්ගලයෙකු හෝ පුද්ගලයින් නම් කළ යුතුය.

## VI වගන්තිය: කමිටු

1. ස්ථාවර කාරක සභා පහත සඳහන් පරිදවේ:

i). ශාස්ත්‍ර පීඨ සංවර්ධනය

ii). ශාස්ත්‍ර පීඨ ශිෂ්‍ය සුබසාධනය

iii). මූල්‍යන

iv). මහජන සම්බන්ධතා සහ විද්‍යාර්ථී සුබසාධනය

v). අඛණ්ඩ අධ්‍යාපනය සහ ව්‍යාප්ති අධ්‍යාපනය

vi). විද්‍යාර්ථී කණ්ඩායම් වාර්ෂික රැස්වීම් සහ නැවත එක්වීම්

2. ඉහත සඳහන් කළ ස්ථාවර කාරක සභාවලට අමතරව, නිශ්චිත අරමුණක් සඳහා අවශ්‍ය වූ විටෙක විධායක කමිටුව විසින්, වෙනත් කාරක සභාවක් හෝ අනු කාරක සභාවක් පත් කළ හැකිය.

3. එක් එක් ස්ථාවර කාරක සභාව හෝ අනු කාරක සභාව වසරක කාලයක් සඳහා විධායක කමිටුව විසින් නම් කරනු ලැබේ.

4. සෑම ස්ථාවර කාරක සභාවක් හෝ අනු කාරක සභාවක් අවම වශයෙන් සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, ඉන් එක් අයෙකු විධායක කමිටුවේ සාමාජිකයෙකු විය යුතුය.

5. (i) ශාස්ත්‍ර පීඨ සංවර්ධනය සහ (ii) ශාස්ත්‍ර පීඨ ශිෂ්‍ය සුබසාධනය පිළිබඳ ස්ථාවර කාරක සභා සංගමයේ උප සභාපතිවරයෙකු විසින් දරනු ලබන අතර මුදල් පිළිබඳ ස්ථාවර කාරක සභාවේ සභාපතිත්වය දරනු ලබන්නේ සංගමයේ භාණ්ඩාගාරිකවාරයා විසිනි. අනෙකුත් කාරක සභා හෝ අනු කාරක සභා සඳහා ඒවායෙහි සිටින සාමාජිකයන් අතුරෙන් සිය කමුටුවල සභාපතිවරුන් තෝරා ගත හැකිය.

6. සංගමයේ ප්‍රධාන ලේකම්වරයා හෝ සහකාර ලේකම්වරුන්ගෙන් එක් අයෙකු හෝ ප්‍රධාන ලේකම්වරයා විසින් නම් කරන ලද වෙනත් සාමාජිකයෙකු විසින් එක් එක් ස්ථාවර කමිටුවේ හෝ අනු කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතුය.

## VII වගන්තිය: AFAAUP ලේකම් කාර්යාලය සහ සංගමයේ නිල මුද්‍රාව

1. සංගමයේ විධායක කමිටුවේ ඉල්ලීම මත පීඨාධිපතිවරයා විසින් තීරණය කරනු ලබන පරිදි සංගමයේ ලේකම් කාර්යාලය පිහිටුවනු ලැබේ.

2. සංගමයේ ප්‍රධාන ලේකම්වරයා විසින් පීඨයේ පීඨාධිපතිවරයා, සභාපතිවරයා සහ විධායක කමිටුවෙහි එකගතාවය මත සංගමය හා සම්බන්ධ පරිපාලන කටයුතු සිදූ කළ යුතුවේ.

3. සංගමයේ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම භණ්ඩගාරිකවාරයාගේ වගකීම වේ. ඔහු/ඇය සාමාජිකත්වයේ වාර්ෂික මහා සභා රැස්වීමේ ප්‍රකාශයට අමතරව සෑම වසරකම ජනවාරි මාසයේදී විධායක කමිටුවට වාර්ෂික ගිණුම් ප්‍රකාශයක් ලබා දිය යුතුය.

4. සංගමයේ නිල මුද්‍රාව සංගමයේ ප්‍රධාන ලේකම් භාරයේ තබා ගත යුතුය.

5. සංගමයේ සභාපතිවරයා හෝ උප සභාපතිවරුන්ගෙන් කිසිවකු ඉදිරියේදී හැර, සංගමයේ නිල මුද්‍රාව, ප්‍රධාන ලේකම්වරයා විසින් කිසිදු ලේඛනයකට නොතැබිය යුතුය.

## VIII වගන්තිය: සංගමයේ සාමාජිකයන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම

1. විධායක කමිටුව විසින් නියම කරන ලද වේලාවක සහ ස්ථානයක, සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමක්, සෑම වසරකම මාර්තු 31 වන දින හෝ ඊට පෙරදිනකදී, පවතින තත්ත්වයට අනුව ගැළපෙන සුදුසු ආකාරයකට භෞතිකව හෝ නිවැරදි නවීන තාක්ෂණය සහ අන්තර්ජාල පහසුකම් භාවිතා කරමින් මාර්ගස්තව හෝ දෙමුහුන් ආකෘතියකින් හෝ, පැවැත්විය යුතුය.

2. සාමාජිකයින් තිහකට නොඅඩු හෝ සාමාන්‍ය සාමාජිකත්වයෙන් 1/3 ට නොඅඩු සංඛ්‍යාවකගේ ලිඛිත ඉල්ලීම පරිදි සංගමයේ ප්‍රධාන ලේකම්වරයා විසින් සංගමයේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය හැක.

3. සංගමයේ ප්‍රධාන ලේකම්වරයා විසින් විධායක කමිටුවේ අනුමැතිය අනුව, භෞතිකව හෝ පවතින තත්වයට අනුව අන්තර්ජාල පහසුකම් සහිතව නිවැරදි නවීන තාක්ෂණය තෝරා ගනිමින් හෝ, ගැළපෙන සුදුසු ආකාරයකට දෙමුහුන් මාර්ගස්ත ආකෘතියක් භාවිතා කරමින් හෝ, වාර්ෂික සාමාජික මහ සභා රැස්වීම හෝ විශේෂ මහ සභා රැස්වීමක් කැඳවිය යුතුය. රැස්වීමක් සඳහා වන ගණපූරණය එහි සාමාජිකත්වයෙන් තුනෙන් එකකට නොඅඩු විය යුතුය.

## IX වගන්තිය: මූල්‍ය වර්ෂය, නෛතික සහ මූල්‍යන කටයුතු

1. සංගමයේ මූල්‍ය වර්ෂය ජනවාරි පළමුවැනිදා සිට දෙසැම්බර් තිස්එක්වැනිදා දක්වා විය යුතුය.

2. වාර්ෂික මහා සභා රැස්වීමේදී පත් කරන ලද වරලත් ගණකාධිකාරීවරුන්ගේ ලියාපදිංචි සමාගමක් විසින් මූල්‍ය වර්ෂය අවසානයේ සංගමයේ වාර්ෂික ගිණුම් විගණනය කළ යුතුය.

3. විධායක කමිටුව විසින් කලින් කලට තීරණය කළ හැකි පරිදි සංගමයේ සියලුම අරමුදල් බැංකු සහ/හෝ එවැනි වෙනත් මූල්‍ය ආයතනවල ජංගම ගිණුම් සහ/හෝ ඉතුරුම් ගිණුම් සහ/හෝ ස්ථාවර තැන්පතු වල සංගමයේ බැරට තැන්පත් කළ යුතුය.

4. සංගමයේ නමින් නිකුත් කරන ලද සියලුම චෙක්පත්, කෙටුම්පත්, මුදල් ගෙවීම සඳහා සහ මුදල් ආපසු ගැනීමේ නියෝග, නෝට්ටු හෝ ණයගැතිභාවය පිළිබඳ වෙනත් සාක්ෂි සියල්ල, (i). සංගමයේ සභාපතිවරයා හෝ ප්‍රධාන ලේකම්වරයා හෝ විධායක කමිටුව විසින් බලය පවරන ලද උප සභාපතිවරයෙකු විසින් සහ (ii). සංගමයේ භාණ්ඩාගාරිකවරයා හෝ ඔහු/ඇය නොපැමිණී අවස්ථාවකදී, සහකාර භාණ්ඩාගාරිකවරයා විසින් අත්සන් කළ යුතුය.

5. ශාස්ත්‍ර පීඨ විද්‍යාර්ථී සංගමයට ලැබෙන අරමුදල් පරිත්‍යාග සඳහා වන, “ශාස්ත්‍ර පීඨ විද්‍යාර්ථීන්ගේ සංගමයේ පරිත්‍යාග අරමුදල” ලෙස හඳුන්වනු ලබන විශේෂ අරමුදලක් සංගමය විසින් ස්ථාපිත කර නිසි පරිදි පවත්වාගෙන යා යුතුය.

## X වගන්තිය: සාමාජික ගාස්තු

සාමාජිකයා විසින් සංගමයට ගෙවිය යුතු සාමාජික ගාස්තු, විධායක කමිටුව විසින් කලින් කලට ගැළපෙන පරිදි සංසෝධනය කිරීම පිනිස යෝජනා කරනු ලැබිය හැකි වන අතර එම සංසෝධිත නව ගාස්තු සඳහා වාර්ෂික මහා සභා රැස්වීමේදී හෝ විශේෂ මහා සභා රැස්වීමේදී අනුමැතිය ලබා ගත යුතුය.

## XI වගන්තිය: ව්‍යවස්ථාමය සංශෝධන

සංගමයේ ව්‍යවස්ථාවේ වෙනස්කම් සිදු කළ හැක්කේ විධායක කමිටු රැස්වීමකදී අවම වශයෙන් විධායක කමිටු සාමාජිකයින්ගේ තුනෙන් දෙකක අනුමැතියෙන් සහ වාර්ෂික මහා සභා රැස්වීමේදී හෝ විශේෂ මහා සභා රැස්වීමේදී සාමාන්‍ය බහුතරයක අනුමැතිය ඇතිව පමණි.

## XII වගන්තිය: අතුරු ව්‍යවස්ථා, යොමු කොන්දේසි, පරිපාලන රෙගුලාසි සහ මාර්ගෝපදේශ

සංගමයේ යහපැවැත්ම සඳහා කවර අවස්ථාවක හෝ අවශ්‍ය වන්නාවූ අතුරු ව්‍යවස්ථා, යොමු කොන්දේසි, පරිපාලන රෙගුලාසි හෝ මාර්ගෝපදේශ, විධායක කමිටුවේ සම්පූර්ණ සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකක අනුමැතිය ඇතිව සහ වාර්ෂික මහා සභා රැස්වීමේදී හෝ විශේෂ මහා සභා රැස්වීමේදී සාමාන්‍ය සාමාජිකත්වයේ සරල බහුතරයකගේ අනුමැතිය ඇතිව, සංගමයේ ව්‍යවස්ථාවට එකතු කළ හැකිවේ.

*AFAAUP / November 28, 2022: R&AFV.*

---------------------

Ref:
(1). Constitution of the Alumni Association of the University of Peradeniya (AAUP) Amended Version 2021/2022
(2). Statute of the Peradeniya Engineering Faculty Alumni Association (PEFAA)
(3). Statute of the Peradeniya Medical School Alumni Association (PeMSAA)
(4). Statute of the Alumni Association of the Faculty of Agriculture of the University of Peradeniya (AAFAUP).